# ජීවයේ රසායනික පදනම - 034 විද්‍යාව පෙරහුරු අභ්‍යාස 01

සැ.යු:

- මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට වෙනම අභ්‍යාස පොතක් භාවිත කරන්න.
- ප්‍රශ්නය ලියා පිළිතුරු අංකය හා නිවැදි පිළිතුර පමණක් ලියන්න. ( වැරදි වරණ තුන ලිවීම අවශ්‍ය නොවේ.) ප්‍රශ්නයට අදාල රූප සටහන ඇඳින්න.

**නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න .**

01. ප්‍රෝටීන හා ලිපිඩ යන ජෛව අණු දෙවර්ගයේම ඇති මූලද්‍රව්‍ය මොනවා ද?
    1. කාබන්, නයිට්‍රජන් හා ඔක්සිජන්
    2. කාබන්, හයිඩ්‍රජන් හා ඔක්සිජන්
    2. කාබන්, පොස්පරස් හා ඔක්සිජන්
    4. කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන් හා සල්ෆර්

02. නියුක්ලෙයික් අම්ලවල තැනුම් ඒකකය වන්නේ,
    1. මොනොසැකරයිඩ ය.
    2. නියුක්ලියොඩයිඩ ය.
    3. මේද අම්ල ය
    4. ඇමයිනෝ අම්ල ය.

03. මොනොසැකරයිඩ හඳුනාගැනීමට භාවිත කරන රසායනික සංයෝගය වන්නේ ,
    1.අයඩින් කැට ය. 2. අයඩින් ද්‍රාවණය ය. 3. සුඩෑන් iii ය. 4. බෙනඩික්ට් ද්‍රාවණය ය.

04. බුද්ධි හීනතාවය ඇතිවීමට බලපානු ලබන ඛනිජ ලවණය කුමක් ද?
    1. සෝඩියම් 2. යකඩ 3. අයඩින් 4. කැල්සියම්

05. ඔස්ටියෝපොරෝසිස් ඇති වීමට බලපානු ලබන්නේ කුමන විටමිනයක ඌනතාවයක් ද?
    1. විටමින් A 2. විටමින් B 3. විටමින් C 4. විටමින් D

06. එන්සයිම නිස්සාරකයක් සකසා ගැනීමට ගනු ලබන්නේ,
    1. තම්බන ලද මුං බීජ
    2. ප්‍රරෝහණය වන මුං බීජ
    3. වියල් තත්වයේ මුං බීජ
    4. අස්වනු නෙලාගත්

07. ඛනිජ ලවණ තුල අඩංගු මූලද්‍රව්‍ය හා ශාක තුළ ඇති විය හැකි ඌනතා ලක්ෂණය නිවැරදිව දක්වා ඇති ප්‍රකාශය කුමක් ද?
    1. නයිට්‍රජන් - පත්‍ර අනවශ්‍ය ඝනකමකින් යුක්ත වීම
    2. නයිට්රජන් හා පොටෑසියම්- පත්‍රවල හරිතක්ෂය ඇතිවීම.
    3. අයන් - පත්‍ර අග්‍රස්ථය මිය යාම
    4. පොටෑසියම්- මුල්වල වර්ධනය ක්ෂිණ වීම

08. පොල් කිරි මිශ්‍රණයක ප්‍රෝටීන් පරීක්ෂාවට ශිෂ්‍යයෙකු සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයෙන් සම පරිමා එකතු කර කොපර් සල්ෆේට් ද්‍රාවණයකින් බිංදුවක් එකතු කළේය.
    ලැබෙන වර්ණය කුමක් ද?
    1. ගඩොල් රතු පාට
    2. දම් පැහැයට හුරු නිල් පාට
    3. රෝස පැහැයට හුරු දම් පාට
    4. කොළ පාටට හුරු නිල් පාට




09. ජලයේ අද්‍රාව්‍ය විටමින් වනුයේ,
    1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. D හා K ය.

10. මුඛ කොන් වණ වීම සිදු වන්නේ කුමන විටමිනයක් ඌන වීමෙන් ද?

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

11. සජීව පදාර්ථයේ ප්‍රධාන ජෛව අණු දෙකක් වන්නේ,
1. කාබෝහයිඩ්රේට් හා ප්‍රෝටීන් ය. 2. විටමින් හා ඛනිජ ලවණ ය.
2. ඛනිජ ලවණ හා ප්‍රෝටීන් ය. 4. විටමින් හා නියුක්ලෙයික් අම්ල ය.

12. ප්‍රෝටීනවල තැනුම් ඒකකය වන්නේ ,
1. මොනොසැකරයිඩ ය. 2. නියුක්ලියොඩයිඩ ය.
3. මේද අම්ල ය 3. ඇමයිනෝ අම්ල ය.

13. රක්ත හීනතාවය, නිද්‍රාශීලීභාවය ඇතිවන්නේ කුමන ඛනිජ ලවණයක ඌනතාවයක් නිසා ද?
1. සෝඩියම් 2. අයන් 3. අයඩින් 4. කැල්සියම්

14. ඩයි සැකරයිඩයකට නිදසුනක් වන්නේ පහත ඒවායින් කුමක් ද?
1. ග්ලූකෝස් 2. සුක්රෝස් 3. පිෂ්ටය 4. කාබෝහයිඩ්රේට්

15. දත්වල එනමලය සෑදීමට අවශ්‍ය වන්නේ කුමන විටමිනය ද?
1. විටමින් A 2. විටමින් B 3. විටමින් C 4. විටමින් K

16. ලිපිඩ හා කාබෝහයිඩ්රේට්වල තැනුම් ඒකකයක් බැගින් පිළිවෙලින් දැක්වූ විට,
1. මේද අම්ල සහ අමයිනෝ අම්ල වේ. 2. ඇමයිනෝ අම්ල සහ මේද අම්ල වේ.
3. මේද අම්ල සහ ග්ලිසරෝල් වේ. 4. ග්ලිසරෝල් සහ මොනොසැකරයිඩ වේ.

17. ඛනිජ ලවණ තුල අඩංගු මූලද්‍රව්‍ය හා මානව දේහය තුළ ඇති විය හැකි ඌනතා ලක්ෂණය නිවැරදිව දක්වා ඇති ප්‍රකාශය කුමක් ද?
1. සෝඩියම් - අස්ථි දුර්වල වීම. 2. අයන් - මානසික සංවර්ධකයේ දුබලතා
3. කැල්සියම් - කෙන්ඩා පෙරලීම. 4. පොටෑසියම් - ඔස්ටියෝපොරෝසිස්

18. ඉතා වියලි තත්වයේ ශාක හෝ සත්ව දේහ කැබැල්ලක් කෝවක දමා තදින් රත් කළ විට පිටවන ජලය හඳුනා ගැනීමට යොදා ගන්නා කොපර් සලග්ෆේට්වල සිදුවන වර්ණ විපර්යාසය කුමක් ද?
1. රෝස පාට → නිල් පාට 2. නිල් පාට → දම් පාට
3. සුදුපාට → නිල් පාට 4. නිල් පාට → රෝස පාට

19. රතු රුධිරාණු සෑදීම හා රුධිරය කැටි ගැසීමට අවශය සංඝටක සෑදීමට අවශ්‍ය වන්නේ කුමන විටමිනද?
1. B හා A 2. C හා B 3. C හා D 4. B හා K

20. රූපයේ දැක්වෙන රෝගය හඳුන්වන නම හා එය ඇතිවීමට අඩු විය යුතු විටමිනය වන්නේ ,



1. දත් දිරායාම හා විටමින් A ය.

2. රක්තහීනතාවය හා විටමින් B ය.

3. විදුරුමස් දුර්වල වීම/ලේ ගැලීම හා විටමින් C

4. විදුරුමස්වලින් ලේ ගැලීම හා විටමින් D ය.